# උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ,2024
General Certificate of Education (Advanced Level) Examination,2024

**ගිණුම්කරණය I**
**Accounting I**

**33 S I**

**13 ශ්‍රේණිය**

**අවසාන වාර පරීක්ෂණය - ඔක්තෝම්බර් 2024**

***පැය දෙකයි***
***Two hours***

නම :……………………………………………………………………………

**උපදෙස් :**

* අංක **1 සිට 30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
* අංක **31 සිට 50** තෙක් වූ ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු අදාළ තිත් ඉර මත** ලියන්න.
* සෑම ප්‍රශ්නයකට ම **ලකුණු දෙක** බැගින් හිමිවේ.
* **ඔබගේ නම** ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.

| **පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.** | |
|---|---|
| **I පත්‍රය සඳහා** | |
| **ප්‍රශ්න අංකය** | **ලකුණු** |
| **01 - 30** | |
| **31 - 50** | |
| **එකතුව** | |

**01.** ගිණුම්කරණයේ අරමුණු සඳහා වඩාත් නිවැරදි පිළිතුර,

1. ව්‍යාපාරයේ ගණුදෙනු හා සිද්ධි සටහන් කිරීම, මැනීම හා වාර්තා කිරීම.
2. අභ්‍යන්තර පාර්ශව සඳහා තීරණ ගැනීමට තොරතුරු සැපයීම.
3. බාහිර පාර්ශව වෙත තීරණ ගැනීමට මූල්‍ය තොරතුරු සැපයීම.
4. ඇල්ම ඇති පාර්ශවයන්ට ආර්ථික තීරණ ගැනීමට මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු සැපයීම.
5. කළමනාකරුවන්ට තීරණ ගැනීම සඳහා මූල්‍ය තොරතුරු සැපයීම. (……)

**02.** නීත්‍යානුකූල අයිතියක් නොමැති බදු දේපළ ව්‍යාපාරයේ වත්කම ලෙස හඳුනා ගැනීමට පදනම සපයන සංකල්පය,

1. ගැලපුම් සංකල්පය
2. ආරක්ෂණ සංකල්පය
3. අඛණ්ඩ පැවැත්ම සංකල්පය
4. සංගත‍ා සංකල්පය
5. යථා රූපී සංකල්ප (……)

**03.** විකිණීමේ සහ ආපසු එවීමේ පදනම මත යැවූ තොග විකුණුම් ලෙස හඳුනා නොගැනීම කවර සංකල්පයට අයත් වේද?

1. උපලබ්ධි සංකල්පය
2. කාලච්ඡේද සංකල්පය
3. මූල්‍ය මිනුම් සංකල්පය
4. ගැලපුම් සංකල්පය
5. අරක්ෂණ සංකල්පය (……)



[ අනික් පිටුව බලන්න.

- **ප්‍රශ්න අංක 4,5 හා 6 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

කමල් විසින් රු. 500000 මුදලක් යොදා රෙදි පිළි අලෙවි සැලක් ආරම්භ කරන ලද අතර මාසය තුළ සිදු කළ ගණු දෙනු පහත දැක්වේ.

4/1 නිමල් වෙළඳ සැළෙන් පිරිවැය රුː 600 000 වූ රෙදි තොගයක් ණයට ගත්තා.

4/2 රුː 400 000 කට ලී බඩු උපකරණ මිලට ගත්තා

4/5 නිමල් වෙළඳ සැළට පිරිවැය 40 000 වූ රෙදි තොග ආපසු යවන ලදී.

4/6 කසුන්ට පිරිවැය 250 000 වු රෙදි තොග පිරිවැයට 20% ලාභයක් සහිත අලෙවි කළේය.

4/7 නිමල් වෙළඳ සැලට ගෙවිය යුතු මුදලින් 50% පියවීමට රුː 10 000 වට්ටමක් අඩු කර මුදල් ගෙව්වේ ය.

4/10 කසුන්ගෙන් රුː 180 000 මුදලක් ලද අතර දුන් වට්ටම රුː 20 000 කි. (……)

**04.** 4/1 සිට 4/5 දින වල සිදු වූ ගණුදෙනු වාර්තා කිරීමට භාවිතා වූ මූලික ලියවිලි අනුපිළිවෙළෙන් දැක්වෙන පිළිතුර,

1. ඉන්වොයිසිය/ ගෙවීම් වවුචරය / හර පත
2. ඉන්වොයිසිය/ ගෙවීම් වවුචරය / බැර පත
3. ඉන්වොයිසිය / ලදුපත/ හර පත
4. ඉන්වොයිසිය / බැරපත / ගෙවීම් වවුචරය
5. ඉන්වොයිසිය / ජ'නල වවුචරය / හරපත (……)

**05.** 4/6 සිට 4/10 දින වල සිදු වූ ගණුදෙනු වාර්තා කිරීමට භාවිතා වූ මූලික පොත් අනුපිළිවෙළෙන් දැක්වෙන පිළිතුර,

1. විකුණුම් ජ'නලය / ලැබීම් මුදල් ජ'නලය / ගෙවීම් මුදල් ජ'නලය
2. ගැනුම් ජ'නලය / ගෙවීම් මුදල් ජ'නලය / ලැබීම් මුදල් ජ'නලය
3. විකුණුම් ජ'නලය/ ගෙවීම් මුදල් ජ'නලය / ලැබීම් මුදල් ජ'නලය
4. ගැණුම් ජ'නලය / පොදු ජ'නලය / ලැබීම් මුදල් ජ'නලය
5. විකුණුම් ජ'නලය / ගෙවීම් මුදල් ජ'නලය /පොදු ජ'නලය (……)

**06.** අප්‍රේල් මාසයේ අවසන් වන විට ගිණුම් සමීකරණයට වූ ශුද්ධ වෙළඳාම නිරූපණය වන පිළිතුර රුː (000)

| | **වත්කම්** | = | **වගකීම්** | + | **හිමිකම්** |
|---|---|---|---|---|---|
| 1. | +300 | = | +290 | + | 40 |
| 2. | +830 | = | + 290 | + | 540 |
| 3. | + 1230 | = | +690 | + | 540 |
| 4. | + 730 | = | 690 | + | 40 |
| 5. | + 850 | = | 290 | | + 560 |

(……)

**07.** 2024 මාර්තු මාසයේ සේවකයන්ට ගෙවූ වැටුප් රුː 900 000 කි. දළ වැටුප මත සේවක ආර්ථ සාධක අරමුදලට සේවක සේවක දායක 8% හා සේව්‍ය දායක 12% කි. දළ වැටුප මත සේවක භාරක අරමුදලට සේව්‍ය දායක 3% කි. මාසයේ සේවකයන්ට වැටුප් ගෙවීමේදී ඔවුන්ගෙන් නිවාස ණය සඳහා රුː 20 000 මුදලක් හා සේවක අර්ථ සාධක අරමුදලට සේවක දායක පමණ අඩු කර ගෙන ඇත. සේවකයින්ට අදාළ මුලු වැටුප් වියදම හා ගෙවිය යුතු සේවක අර්ථසාධක සේවකයින්ට අදාළ අරමුදල් ගණන කරන්න.

| | මුළු වැටුප් වියදම රු(000) | සේවක අර්ථසාධක අරමුදල් දායක (ගෙවිය යුතු) රු (000) |
|---|---|---|
| 1. | 1150 | 200 |
| 2. | 1000 | 200 |
| 3. | 1150 | 230 |
| 4. | 1150 | 150 |
| 5. | 1120 | 150 |

(……)

**08.** ව්‍යාපාරයේ ගිණුම් පොත් පරීක්ෂා කිරීමේ දී පහත වැරදි අනාවරණය විය.

A) ගෙවූ බැංකු ණය පොලී රුː 100 000 ණය පොලී ආදායම් ගිණුමට රුː 10 000 ලෙස සටහන් වී ඇත.
B) රුː 50000 ලී බඩු අලුත්වැඩියා වියදමක් ලිබඩු ගිණුමට පිටපත් වි ඇත.
C) දුන් වට්ටම් රුː 15 000 ලද වට්ටම් ගිණුමට බැර ලියා ඇත.

ඉහත වැරදි නිසා අවිනිශ්චිත ගිණුමක් ඇති වීමට බලපෑ ගණුදෙනු ඇතුළත් පිළිතුර

1. A පමණි.
2. B පමණි.
3. A හා B පමණි.
4. A හා C පමණි.
5. A,B හා C යන සියල්ල ම

(……)

**09.** මුළු විකුණුම් රුː 2400 000 කි. විකුණුම් මිළ මත ලාභය 20% කි. 23.4.1 ඉතිරි තොගය රුː 220 000 හා ගැණුම් 2100 000 විය. 24.3.31 අවසන් වසර තුළ ඇති වූ ගින්නක් නිසා ව්‍යාපාරයේ හානි සිදු වී ඇත. හානි තොග සඳහා රක්ෂණ සමාගම 80% වන්දි ගෙවීමට එකඟ වී ඇත. 24.3.31 දින හානි තොගයේ පිරිවැය හා ලැබිය යුතු රක්ෂණ වන්දිය ගණනය කරන්න.

| | හානි තොග රු(000) පිරිවැය | ලැබිය යුතු රක්ෂණ වන්දි රු (000) මුදල |
|---|---|---|
| 1. | 330 | 200 |
| 2. | 320 | 200 |
| 3. | 320 | 256 |
| 4. | 400 | 320 |
| 5. | 400 | 200 |

(……)

**10.** ලී බඩු නිෂ්පාදන ව්‍යාපාරයක තොරතුරු පහත දැක්වේ. රුː 000

| | | |
|---|---|---|
| 23.4.1 | අමු ද්‍රව්‍ය තොගය | 80 |
| 23.4.1 | නොනිමි තොගය | 20 |
| | අමුද්‍රව්‍ය ගැණුම් | 560 |
| | සෘජු ශ්‍රම පිරිවැය | 140 |
| | නිෂ්පාදන පොදු කාර්ය වියදම් | 350 |
| 24.3.31 | ඉතිරි අමුද්‍රව්‍ය | 60 |
| 24.3.31 | නොනිමි තොග | 40 |

(නොනිමි තොග නිෂ්පාදන පිරිවැයට අගය කරනු ලබයි. නිෂ්පාදන පිරිවැය හා ප්‍රාථමික පිරිවැය ඇතුළත් නිවැරදි පිළිතුර

| | නිෂ්පාදන පිරිවැය (රු: 000) | ප්‍රාථමික පිරිවැය (රු: 000) |
|---|---|---|
| 1. | 1160 | 570 |
| 2. | 1000 | 720 |
| 3. | 1160 | 720 |
| 4. | 1050 | 700 |
| 5. | 1050 | 720 |

(……)

**11.** 24.3.31 අවසන් වර්ෂයේ තොරතුරු පහත දැක්වේ. (රු:000)

| | | | |
|---|---|---|---|
| 23.4.1 | ශේෂය | වෙළෙඳ ලැබිය යුතු ශේෂය | 450 |
| | | වෙළෙඳ ගෙවිය යුතු ශේෂය | 260 |
| | | තොගය | 190 |
| 24.3.31 | ශේෂය | වෙළඳ ලැබිය යුතු ශේෂය | 600 |
| | | වෙළඳ ගෙවිය යුතුය ශේෂය | 400 |
| | | උපචිත මෙහෙවුම් වියදම් | 40 |
| | | තොගය | 290 |
| 2023/24 වර්ෂයේ | | වෙළෙඳ ණයගැතියන් ලද මුදල් | 1350 |
| | | වෙළෙඳ ගෙවිය දැ ගෙවූ මුදල් | 750 |
| | | දුන් වට්ටම් | 20 |
| | | ලද වට්ටම | 30 |
| | | මෙහෙයුම් වියදම් ගෙවීම | 210 |

දළ ලාභය හා ශුද්ධ ලාභය දැක්වෙන පිළිතුර

| | ශුද්ධ ලාභය (රු: 000) | දළ ලාභය (රු:000) |
|---|---|---|
| 1. | 1520 | 700 |
| 2. | 700 | 480 |
| 3. | 480 | 700 |
| 4. | 480 | 820 |
| 5. | 920 | 700 |

(……)

**12.** ලාභ නොලබන ව්‍යාපාර සම්බන්ධයෙන් පහත ප්‍රකාශන වලින් සත්‍ය ප්‍රකාශ/ ප්‍රකාශය වන්නේ,

A) ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර වල ආදායම් ප්‍රකාශනය උපචිත පදනමට සකස් කරයි.

B) විශේෂ පරිත්‍යාගයකින් ලද මුදල අදාළ කාර්යය නිම කළ පසු ඉතිරිවන ශේෂය ආදායම් ප්‍රකාශනයේ ආදායමක් ලෙස හඳුනා ගත යුතුය.

C) ලැබීම් හා ගෙවීම් ගිණුම ශේෂය අතිරිතය හෝ ඌණතාව ලෙස හඳුනා ගනියි.

1. A පමණි.
2. B පමණි.
3. A හා B පමණි.
4. A හා C පමණි.
5. A,B හා C යන සියල්ල ම (……)

**13.** පහත ප්‍රකාශන අතරින් හවුල් ව්‍යාපාරයකට අදාල වැරදි ප්‍රකාශන ඇතුළත් පිළිතුර,

1. ප්‍රාග්ධනයට අමතරව සපයන ණය සඳහා ණය පොලී පිළිබඳ හවුල් ගිවිසුමේ නොමැති නම් 24 වගන්තියට අනුව 5% වාර්ෂික පොළියක් හිමිවේ.
2. ගිවිසුමේ හවුල් වේතන සඳහන් වි නොමැති නම් හවුල්කරුවන්ට වේතනය හිමි නොවේ.
3. නිෂ්පාදන හවුල් ව්‍යාපාරයක නිෂ්පාදන කළමනාකරුවන් වන හවුල්කරුගේ වේතනය ලාභ අලාභ විසර්ජන යටතේ දක්වයි
4. හවුල් ගිවිසුමක් නොමැති නම් හවුල් ව්‍යාපාරයේ ලාභ අලාභ සමව බෙදා ගත යුතු ය.
5. හවුල් ව්‍යාපාරය සිටිය හැකි උපරිම හවුල්කරුවන් සංඛ්‍යා 2007. අංක 7 දරණ සමාගම් පනත අනුව තීරණ කරයි. (……)

14 හා 15 වන ප්‍රශ්න සඳහා පහත ගණුදෙනු අදාළ වේ.

දසුන් හා කසුන් ලාභ අලාභ සමව බෙදාගත් හවුල් ව්‍යාපාර 23.4.1 හිමිකම් පහත දැක්වේ.

| 23.4.1 | මූළු හිමිකම (රු. 000) | ජංගම ගිණුම (රු. 000) |
|---|---|---|
| දසුන් | 2500 | 100 |
| කසුන් | 2300 | (100) හර |

23.4.1 නව හවුල්කරුවකු ලෙස තිසර බඳවා ගත්තේ ය. එදිනම මුළු කීර්ති නාමය රුː 500 000 තක්සෙර කළේ ය. තිසර ප්‍රාග්ධනයට මුදලින් රුː 1300 000 රුගෙන ආවේ ය. නව ලාභ අලාභ අනුපාතය පිළිවෙළින් 2:2:1 බෙදා ගැනීමට එකඟ විය.

24.3.31 වසරේ හවුල් ව්‍යාපරයේ මුළු ශුද්ධ ලාභය රුː 1200 000 ලෙස උපයා ඇත.

හවුල්කරුගේ ගැනිලි දසුන් මුදලින් රුː 50 000 හා කසුන් රුː 100 000 ගෙන ඇත.

- හවුල් ව්‍යාපාරයේ රක්‍ෂණ ගාස්තු රුː 75 000 තිසර විසින් ඔහුගේ පෞද්ගලික මුදලින් ගෙවා ඇත. මේ පිළිබඳ ගිණුම් පොත් වල සටහන් කර නොමැත.

**14** 24.3.31 දිනට හවුල් ව්‍යාපාරයේ මුළු හිමිකම හා තිසරගේ මුළු හිමිකම නිවැරදිව දැක්වෙන පිළිතුර

| | **මුළු හිමිකම (රුː 000)** | **තිසරගේ හිමිකම් (රුː000)** |
|---|---|---|
| 1. | 7150 | 1500 |
| 2. | 6100 | 1200 |
| 3. | 6100 | 1515 |
| 4. | 7150 | 1515 |
| 5. | 7150 | 1200 |

(……)

**15.** 24.3.31 දිනට කසුන්ගේ ලාභ කොටස හා දසුන්ගේ ජංගම ගිණුමේ ශේෂය නිවැරදිව දැක්වෙන පිළිතුර

| | **කසුන්ගේ ලාභ කොටස (රුː 000)** | **දසුන්ගේ ජංගම ගිණුම් ශේෂය 0:000)** |
|---|---|---|
| 1. | 450 | 500 |
| 2. | 450 | 280 |
| 3. | 530 | 240 |
| 4. | 240 | 280 |
| 5. | 480 | 500 |

(……)

**16 හා 17 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු අදාළ වේ. 24.3.31 දිනට රමා සමාගමෙන් උපුටා ගත් තොරතුරු පහත දැක්වේ.**

| | **(රු. 000)** |
|---|---|
| විකුණුම් පිරිවැය | 5500 |
| දළ ලාභය | 1500 |
| වෙනත් ආදායම් | 500 |
| මෙහෙයුම් වියදම් | 1200 |

24.3.31 දින ගොඩනැගිල්ලක් මුල් වරට ප්‍රත්‍යාගණන කර ඉන් ලද අතිරිතය රුː 500 000 කි. එමෙන් ම යන්ත්‍ර ප්‍රත්‍යා ගණනයෙන් රුː 300 000 ඌණතාවයන් වාර්තා කර තිබූ අතර මෙම යන්ත්‍ර මීට පෙර ප්‍රත්‍යගණන කර රුː 200 000 අතිරිතයක් වාර්තා කර තිබුණි.

**16.** 24.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනා ගන්නා මුළු ආදායම හා මුළු වියදම,

| | මුළු ආදායම (රුː 000) | මුළු වියදම (රුː000) |
|---|---|---|
| 1. | 7500 | 5500 |
| 2. | 8000 | 7000 |
| 3. | 8000 | 6700 |
| 4. | 7500 | 7000 |
| 5. | 8000 | 1500 |

(……)

**17.** 24.3.31 දිනෙන් අවසන් වර්ෂය වෙනත් විස්තීරණ ආදායම හා මුළු විස්තීරණ ආදායම

| | **වෙනත් විස්තීරණ ආදායම (රු: 000)** | **මුළු විස්තීරණ ආදායම (රු:000)** |
|---|---|---|
| 1. | 500 | 700 |
| 2. | 300 | 1000 |
| 3. | 500 | 200 |
| 4. | 200 | 1000 |
| 5. | 300 | 700 |

(……)

**18.** *LKAS* 2 තොග ප්‍රමිතයට අනුව පහත කවර ප්‍රකාශනය නිවැරදි වේ ද?

A) තොග හා සම්බන්ධිත අයහාරය හඳුනාගන්නා තෙක් වත්කමක් ලෙස ඉදිරියට ගෙන යන තොගයේ පිරිවැය තීරණය කිරීම.

B) තොග යනු නිෂ්පාදන ක්‍රියාවලිය හෝ සේවා සැපයීම සඳහා හෝ විකිනීම සඳහා තබා ගෙන ඇති නිමි භාණ්ඩ, නොනිමි භාණ්ඩ හා අමුද්‍රව්‍ය තොගයේ එකතුවය.

C) තොග පිරිවැය ගණනයේ දී භාවිතා කරන පිරිවැය සූත්‍ර නිර්දේශ කිරීම.

1. A පමණි.
2. B පමණි.
3. A හා B පමණි.
4. A හා C පමණි.
5. A,B හා C යන සියල්ල ම

(……)

**19.** සීමිත නව ලංකා පොදු සමාගමේ 24.03.31 දින අවසන් වසරේ මුදල් ගිණුමේ සාරාංශ පහත දැක්වේ.

| | (000) |
|---|---|
| 23.4.1 මුදල් ශේෂය | 250 |
| අත්පිට විකුණුම් | 500 |
| ණයගැති මුදල් ලැබීම් | 1200 |
| ණයහිමි මුදල් ගෙවීම් | 600 |
| අත්පිට ගැනුම් | 450 |
| මෙහෙයුම් වියදම් ගෙවීම් | 150 |
| ගෙවූ ආදායම් බදු | 90 |
| කාර්යාලීය උපකරණ ගැණුම් | 800 |
| සාමාන්‍ය කොටස් නිකුතුව | 1000 |
| බැංකු ණය පොලී ගෙවීම | 50 |

$LKAS\ 7$ මුදල් ප්‍රවාහ ප්‍රකාශන ප්‍රමිතය අනුව 24.3.31 දිනෙන් අවසන් වර්ෂයට මෙහෙයුම් කටයුතුවලින් ජනන වූ ශුද්ධ මුදල් ප්‍රවාහය

1. රු: 360 000
2. රු: 500 000
3. රු: 140 000
4. රු: 90 000
5. රු: 300 000

(……)

**20.** AB සමාගම සතුව යන්ත්‍ර පැවතියේ, එහි තොරතුරු පහත දැක්වේ.

23.3.31 දිනට යන්ත්‍රයේ පිරිවැය 1200 000

23.3.31 දිනට යන්ත්‍ර සමුච්ත ක්ෂය වෙන් කිරීම 240 000

23.4.1 දිනට යන්ත්‍රයේ ප්‍රත්‍යාගණන අගය රු: 1000 000 ය. ඵලදායි ජීව කාලය වසර 10 කි. සුන්බුන් අගයක් නොමැත.

24.3.31 අවසන් වර්ෂයට යන්ත්‍ර ක්ෂය වියදම

1. රු: 100 000
2. රු: 120 000
3. රු: 150 000
4. රු: 125 000
5. රු: 130 000

(……)

**21.** සීමිත තිසර පොදු සමාගමේ 24.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂවරු විසින් 24.6.15 අනුමත කරන ලදී. 24.3.31 දින සිට 24.06.15 දක්වා කාලයේ දී පහත සිද්ධීන් සමාගමේ සිදුවිය.

A) 24.4.5 දින ණයට අලෙවි කළ භාණ්ඩ මිලට ගත් ගණුදෙනුකරුවෙකුගෙන් මුදල් අයකර ගැනීමට නොහැකි බව 24.6.01 දින අනාවරණය විය.

B) 24.5.01 දින ව්‍යාපාරයේ ඇති වූ ගින්නක් නිසා 24.3.31 දින තිබූ රු: 300 000 තොගයක් ගින්නෙන් විනාශ විය.

C) 24.3.31 දින පැවති පිරිවැය 500 000 වූ තොගයක් 24.5.10 දින රු: 450 000 ක විකුණා ඇත.

$L.K.K.S-10$ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශනවල නොගැලපෙන සිද්ධි ඇතුළත් පිළිතුර වන්නේ,

1. A පමණි.
2. B පමණි.
3. A හා B පමණි.
4. A හා C පමණි.
5. A,B හා C යන සියල්ල ම

(……)

**22.** සීමිත අමා පොදු සමාගම වගකීම් සහතික කාලයක් සහිතව භාණ්ඩ විකුණනු ලබයි. 23.4.1 දිනට වගකීම් සහිත ප්‍රතිපාදනය රු: 610 000 විය. 24.3.31 අවසන් වර්ෂ සඳහා ගෙවූ වගකීම් සහතික වියදම් රු: 450 000 කි. එමෙන් ම 24.3.31 අවසන් වර්ෂයට වගකීම් සහිත සඳහා ප්‍රතිපාදනය 720 000 විය. $L.K.A.S.37$ ප්‍රතිපාදන අසම්භාවය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතියට අනුව ලාභ අලාභ ප්‍රකාශනයේ දැක්විය යුතු වගකීම් සහතික වියදම් හා මූල්‍ය තත්ව ප්‍රකාශයේ දැක්විය යුතු වගකීම් සහතික ප්‍රතිපාදන කොපමණද?

| | වගකීම් සහතික වියදම (රු: 000) | වගකීම් සහතික ප්‍රතිපාදනය (රු:000) |
|---|---|---|
| 1. | 560 | 610 |
| 2. | 560 | 450 |
| 3. | 450 | 610 |
| 4. | 560 | 720 |
| 5. | 450 | 720 |

(……)

**23.** ආහාර නිෂ්පාදන ව්‍යාපාරයක තොරතුරු පහත දැක්වේ.

| | (000) |
|---|---|
| මුළු විකුණුම් | 10000 |
| 23.4.1 වෙළඳ ලැබිය යුතු දෑ | 1200 |
| 24.3.31 වෙළඳ ලැබිය යුතු දෑ | 800 |

විකුණුම් වලින් 20% අත්පිට විකුණුම් වේ. වර්ෂයට දින 360 ලෙස උපකල්පනය කරන්න. සමාගමේ ණයගැති පිරිවැටුම් අනුපාතය හා ණයගැති මුදල් ලැබීමේ කාලය ගණනය කරන්න.

| | **ණයගැති පිරිවැටුම් අනුපාතය (වාර)** | **ණයගැති මුදල් ලැබීම් කාලය** |
|---|---|---|
| 1. | 8 | දින 45 |
| 2. | 10 | දින 36 |
| 3. | 6 | දින 90 |
| 4. | 5 | දින 72 |
| 5. | 20 | දින 18 |

(……)

**24.** කළමනාකරණ ගිණුම්කරණයට අදාළ වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

1. ඇල්ම ඇති පාර්ශව වෙත කළමනාකරණ වාර්තා සපයනු ලබයි.
2. මූල්‍ය තොරතුරු පමණක් කළමනාකරණ ගිණුම්කරණ සඳහා අදාළ කර ගනියි.
3. කළමනාකර වාර්තා කළමනාකරණයේ අවශ්‍යතා මත වසරකට වාර කිහිපයක් තුළ වාර්තා සපයනු ලබයි.
4. අතීත තොරතුරු පමණක් කළමනාකරණ ගිණුම්කරණයේ ම භාවිතා කරයි.
5. කළමණාකරණයේ ගිණුම්කරණයේ නිමවුම් වන්නේ මූල්‍ය ප්‍රකාශනය (……)

**25.** තනි භාණ්ඩයක් නිෂ්පාදන කරන සමාගමක මෙහෙයුම් කටයුතු 23.4.1 ආරම්භ කළේ ය. 24.3.31 අවසන් වර්ෂ සඳහා තොරතුරු පහත දැක්වේ.

| | (000) |
|---|---|
| ඍජු අමුද්‍රව්‍ය පිරිවැය | 500 |
| ඍජු ශ්‍රම පිරිවැය | 400 |
| අයවැය ගත මුළු පොදු කාර්ය පිරිවැය | 400 |

පොදු කාර්ය පිරිවැයක් 60% නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය වේ. අයවැය ගත නිෂ්පාදන ඒකක ගණන 20 000 කි. ඒකකයක නිෂ්පාදන පිරිවැය හා ඒකකයක මුළු පිරිවැය

| | **නිෂ්පාදන ඒකක පිරිවැය** | **ඒකකයක මුළු පිරිවැය** |
|---|---|---|
| 1. | රුː 45 | රුː 65 |
| 2. | රුː 57 | රුː 130 |
| 3. | රුː 114 | රුː 150 |
| 4. | රුː 65 | රුː 57 |
| 5. | රුː 57 | රුː 65 |

(……)

**26.** නිෂ්පාදන සමාගමක 24.3.31 අවසන් වර්ෂය අදළ තොරතුරු පහත දැක්වේ.

- මාසික පරිභෝජන ඒකක 3000 කි. නමුත් 24.2.28 හා 24.3.31 මාස සඳහා ද්‍රව්‍ය ඒකක 10 000 බැගින් මිළට ගෙන ඇත.
- ඒකක පිරිවැය රුː 200 කි. ඒකකයක පිරිවැයෙන් 10% ඒකකයක් තබා ගැනීමේ පිරිවැය වේ.
- ඇණයුම පිරිවැය ඇණයුමකට රුː 200 කි.



[ අනික් පිටුව බලන්න.

ආර්ථික ඇණයුම් ප්‍රමාණය $(EOQ)$ හා ඇණයුම් වාර ගණන ගණනය කරන්න.

| | ආර්ථික ඇණයුම් ප්‍රමාණය $(EOQ)$ | ඇණයුම් වාර ගණන |
|---|---|---|
| 1. | 1000 | 48 |
| 2. | 1000 | 42 |
| 3. | 800 | 50 |
| 4. | 848 | 50 |
| 5. | 1000 | 50 |

(……)

**27.** නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය බෙදාහැරීමේ ක්‍රියාවලිය අනුපිළිවෙළින් නිවැරදිව දැක්වෙන පිළිතුරු

1. පිරිවැය රැස්කිරීම / ප්‍රතිපාදනය / විභාජනය / අන්තර්ග්‍රහනය
2. පිරිවැය රැස්කිරීම / ප්‍රතිපාදනය / විභාජනය/ වෙන් කිරීම
3. පිරිවැය රැස්කිරීම/ ප්‍රතිපදනය / අන්තර් ග්‍රහනය / විභාජනය
4. පිරිවැය රැස් කිරීම / ප්‍රාථමික විභජනය / ප්‍රතිපාදනය / අන්තර් ග්‍රහණය
5. පිරිවැය රැස්කිරීම / ද්විතීය විභාජනය / ප්‍රතිපාදනය / අන්තර් ග්‍රහණය (……)

**28 හා 29 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු අදාළ කරගන්න.**

**සමාගමක් තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරන අතර ඒකකයක විකුණුම් මිළ රුः 200 කි. නිෂ්පාදන මට්ටම් දෙකින් අදාළව ඒකක පිරිවැය පහත දැක්වේ.**

| **ඒකක ප්‍රමාණය** | **ඒකක පිරිවැය** |
|---|---|
| 6000 | 360 |
| 8000 | 310 |

ඒකක 9000 දී මුළු පිරිවැය රුः 1580 000 කි.

**28.** සමාගමේ ඒකක විචල් පිරිවැය හා මුළු ස්ථාවර පිරිවැය දැක්වෙන පිළිතුර තෝරන්න.

| | **ඒකකයකට විචල්‍ය පිරිවැය** | **මුළු ස්ථාවර පිරිවැය (රුः000)** |
|---|---|---|
| 1. | 160 | 1200 |
| 2. | 360 | 1200 |
| 3. | 310 | 1200 |
| 4. | 160 | 1500 |
| 5. | 160 | 1400 |

(……)

**29.** සමච්ඡේදන ලක්ෂ්‍ය හා දායක විකුණුම් අනුපාතය

| | **සමච්ඡේදන ලක්ෂ්‍ය (ඒකක වලින්)** | **දායක විකුණුම් අනුපාතය (%)** |
|---|---|---|
| 1. | 13 500 | 20% |
| 2. | 30 000 | 40% |
| 3. | 13 500 | 30% |
| 4. | 40 000 | 20% |
| 5. | 50 000 | 50% |

(……)

**30.** මූලික ආයෝජන රුः 400 000 වන අතර වර්ෂ 03 අවසානයේ දී මෙම ආයෝජනයෙන් සුංබුන් අගය රුः 100 000 වේ යැයි තක්සේරු කර ඇත. වර්ෂ 03 හි ලාභය පහත දැක්වේ.

| වසර | ලාභය |
|---|---|
| 1 | 100 000 |
| 2 | 200 000 |
| 3 | 300 000 |

ව්‍යාපෘතියේ පිළිගෙවුම් කාලය හා ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය නිවැරදිව දැක්වෙන පිළිතුර

| | පිළිගෙවුම් කාලය වසර | ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය | |
|---|---|---|---|
| 1. | අවුරුදු 1 මාස 08 | 90% | |
| 2. | අවුරුදු 01 මාස 06 | 90% | |
| 3. | අවුරුදු 01 මාස 06 | 50% | |
| 4. | අවුරුදු 02 මාස 08 | 80% | |
| 5. | අවුරුදු 01 මාස 08 | 80% | (……) |

**ලකුණු ……..*…….. =……….**

**ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

**31**. *LKAS* 1 ප්‍රමිතයට අනුව පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශනවලට අදාළව පහත ප්‍රකාශ සත්‍ය ($T$) දී අසත්‍ය ($F$) ද යන්න සඳහන් කරන්න.

**සත්‍ය/අසත්‍ය (T/F)**

A. පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හා ඉදිරිපත් කිරීමට පදනම නිර්දේශ  කරයි.

B. තම අවශ්‍යතාවලට ගැලපෙන පරිදි තොරතුරු ඉල්ලා සිටීමට නොහැකි පාර්ශවයන්ගේ තොරතුරු සැපයීමට මූල්‍ය ප්‍රකාශන සකස් කරයි.

C. ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ දැකිය හැකි අනාගත කාලයක් අඛණ්ඩව සිය මෙහෙයුම් කටයුතු යෙදෙන්නේ දැයි උපකල්පනය කරමින් ය.

D. ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන වල මුදල් ප්‍රවාහ ප්‍රකාශ හැර අනෙකුත් මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම සකස් කරයි.

**32**.තොග පාලනයේ දී පහත කාර්යයන් සඳහා භාවිතා වන ලේඛන සඳහන් කරන්න.

**ලේඛනය**

A. නිෂ්පාදන අංශයට අවශ්‍ය ද්‍රව්‍ය ගබඩා වෙත් ඉල්ලුම් කිරීම.

B. ද්‍රව්‍ය මිලට ගන්නා ලෙස ගබඩාවෙන් ගැණුම් අංශයෙන් ඉල්ලීම.

C. ගැණුම් අංශය බාහිර සැපයුම්කරුවන්ගේ ද්‍රව්‍ය ඉල්ලීම.

D. සැපයුම්කරුවන්ගෙන් ගබඩාවට හෝ ගැණුම් අංශයට ද්‍රව්‍ය ලබා ගැනීම.

**33**.පහත ගණුදෙණු නිසා ගිණුම්කරණ සමීකරණයේ හිමිකමට ඇති කරන බලපෑම (ශුද්ධ බලපෑම) වැඩිවේද අඩු වේ වෙනස් නොවේද යන්න සඳහන් කරන්න.

| | ශුද්ධ බලපෑම වැඩිවේ/ (I) අඩු වේ. / (D) වෙනස් නොවේ. NC | වටිනාකම (රු: 000) |
|---|---|---|
| (i) රු:100 000 ණයහිමි ශේෂය පියවීමට 10% වට්ටම අඩු කරමින් අයිතිකරුගේ පෞද්ගලික මුදලින් ගෙවීම. | …………………………… | ……………………… |
| (ii) ලැයිස්තුගත මිළ රු: 200 000 භාණ්ඩ තොගයක් 10% වෙළඳ වට්ටම් අඩු කරමින් ණයට අලෙවි කිරීම මෙම තොගයේ පිරිවැය 150 000 කි. | …………………………… | ……………………… |

**34.** පහත දැක්වෙන ගිණුම් අයත් වන්නේ ලෙජරයේ වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම් හා වියදම් යන වර්ග අතරින් කුමකට දැයි සටහන් කරන්න.

**ලෙජර් ගිණුම් වර්ගය**

A. කලින් ලද සාමාජික මුදල් ..............................

B. ගැනිලි ..............................

C. ආපසු එවුම් ..............................

D. හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීම [redacted]

**35.** 24 03 31 දිනට මුදල් පාලන හර ශේෂය රුː 550 000 වූ අතර එදිනට බැංකු ප්‍රකාශයේ ශේෂය මීට වඩා වෙනස් වී ඇති වෙනසට හේතු

- මාර්තු 25 ණය හිමියන්ට නිකුත් වල රුː 75 000 චෙක් පතත් අගරු වී ඇතී
- තැම්පත් කරන ලද රුː 100 000 චෙක්පත් තවම උපලබ්ධි වී නොමැතී
- නිකුත් කරන ලද රුː 85 000 තවම ගෙවීමට ඉදිරිපත් වී නොමැතී
- ණයගැති සෘජු ප්‍රේෂණ රුː 25 000 හා ස්ථාවර නියෝග ගෙවීම් ණය වාරිකය රුː 20 000 කී

(i) ණයගැති ප්‍රේෂණ හා ස්ථාවර නියෝග ගෙවීම් බැංකු ප්‍රකාශනය ලැබුණු පසුව මුදල් ගිණමේ සටහන් කරනු ලබයී

(අ) සංශෝධිත මුදල් පාලන ශේෂය [redacted]

(ආ) බැංකු ප්‍රකාශනයේ දැක්වෙන ශේෂය [redacted]

(ii) නිකුත් කළ අගරු චෙක් පත රුː 75 000 සටහන් කිරීම අදාළ ජ'නල් සටහනී

| | හර | බැර |
|---|---|---|
| [redacted] ගිණුම [redacted] | | |
| [redacted] [redacted] | | |

**36.** පහත ගණුදෙනු නිසා කඩවී ඇති ගිණුම්කරණ සංකල්පය ලියා දක්වන්නී

**ගිණුම්කරණ සංකල්පය**

A. සාමාන්‍ය කොටස් හිමියන්ට බෙදා හරින ලද ලාභාංශ විකිණීමේ හා බෙදා හැරීමේ වියදම තුළ ගිණුම්ගත කර ඇතී [redacted]

B. අවසන් තොග ශුද්ධ උපලබ්ධිය අගයට මූල්‍ය තත්ව ප්‍රකාශයේ වාර්තා කිරීම [redacted]

C. ලී බඩු නිෂ්පාදන ව්‍යාපාරයක වර්ෂය තුළ මිළට ගත් සුළු උපකරණ ජංගම නොවන වත්කම් ලෙස ගිණුම් ගත කර ඇතී [redacted]

D. කල්බදු ගෙවීමේ ක්‍රමයට ලබාගත් වෑන් රථයක් ව්‍යාපාරයේ වත්කම් ලෙස ගිණුම්ගත කර නොමැතී [redacted]

**37.** නිෂ්පාදන ව්‍යාපාරයක පහත ප්‍රකාශන සඳහා හිස්තැනට වඩාත් යෝග්‍ය පිළිතුරු ලියා දක්වන්න

A. නිෂ්පාදන පිරිවැය මූලිකාංග සෘජු ද්‍රව්‍ය + සෘජු ශ්‍රමය + සෘජු වෙනත් හා [redacted] වේ

B. නිෂ්පාදන පිරිවැය එකතුව [redacted] + නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය වේ

C. නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය වක්‍ර ද්‍රව්‍ය + වක්‍ර ශ්‍රමය හා [redacted] පිරිවැයේ එකතුවකි

D. මුලු නිෂ්පාදන පිරිවැය, නිශ්පාදන නොවන පිරිවැය එකතුව [redacted] පිරිවැය වේ

**38.** වැඩිහිටි සුභ සාධන සංගමයක 24331 තොරතුරු පහත දැක්වේ

| | 2341 | 24331 |
|---|---|---|
| | (000) | (000) |
| හිඟ සාමාජික මුදල් | 25 | 10 |
| කලින් ලද සාමාජික මුදල් | 20 | 15 |
| යාවජීව සාමාජික මුදල් | 240 | ? |

සමිතියේ යාවජීව හැර සාමාජික සංඛ්‍යාව 50 කී මාසික සාමාජික මුදල් රුː 1000 කී යාවජීව සාමාජිකයින් 22401 දිනට 5 දෙනෙකු වසර 5 සඳහා එක් සාමාජිකයකු රුː 60 000 බැගින් ගෙවා ඇති යාව ජීව සාමාජික මුදල් වලින් $\frac{1}{5}$ වසරේ ආදායම ලෙස හඳුනාගැනීම සමිතියේ ප්‍රතිපත්තිය වේ

(i) 24331 අවසන් වසරට අදාළ සාමාජික මුදල් ආදායම [redacted]

(ii) 24331 අවසන් වසරට සාමාජික මුළු ආදායම [redacted]

**39.** පහත ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ලෙස ලියා දක්වන්න

**සත්‍ය / අසත්‍ය**

A. හවුල් ගිවිසුමක් නොමැති නම් හවුල් ව්‍යාපාරයට හවුල්කරුවන් ප්‍රාග් ධනයට කෙසේ දායක වුවත් ලාභ අලාභ සමානව බෙදිය යුතුයි

B. හවුල් ව්‍යාපාරයට සිටිය යුතු උපරිම සාමාජික සංඛ්‍යාව 20 ලෙස හවුල් ආඥා පනතේ 24 වන වගන්තියට දක්වා ඇත.

C. හවුල් ව්‍යාපාරයක අයිතිය වෙනස් වන විට කීර්ති නාමය ගණනය කරයි.

D. හවුල් ව්‍යාපාරයක ඉවත්ව යන හවුල්කරුවෙකුගේ හිමිකම ණය මුදලක් ලෙස ලබා දී ඇත. මෙම ණය මුදල් වලට අදාළව ණය පොළී පිළිබඳ ගිවිසුම තුළ ඇතුළත් වී නොමැත. මෙම මුදලට 1890 හවුල් ආඥානා පනතේ 24 වගන්තියට අනුව වාර්ෂිකව 5% ක පොළියක් හිමි වේ.

**40.** අමා, ධනු, හා සනු ලාබ අලාභ 3 : 1 : 1 ලෙස පිළිවෙළින් බෙදා ගනිමින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයේ ගිවිසුම පහත දැක්වේ.

1) ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත 10% පොළී හිමි වේ.

2) සෑම හවුල්කරුවකුට මාසික හවුල් වේතන රු. 10000 ක් හිමිවේ.

**අනෙකුත් තොරතුරු (රු. 000)**

| | **අමා** | **ධනු** | **සනු** |
|---|---|---|---|
| 2023.04.01 ප්‍රාග්ධන ගිණුම | 3000 | 1000 | 1000 |
| 2023.03.31 ප්‍රාග්ධන ගිණුම | - | 850 | 850 |
| 2023.04.01 ජංගම ගිණුම | 200 | 200 | 100 |
| 2024.03.31 ජංගම ගිණුම | - | 270 | 270 |
| මුදල් ගැනිලි වසර තුළ | 500 | 200 | 100 |

24.03.31 දින අමා හවුල් ව්‍යාපාරයෙන් ඉවත් වූ අතර එදිනට ජංගම ගිණුමේ ශේෂය රු 300 000 කි හවුල් ව්‍යාපාරයේ අමාගේ කීර්ති නම කොටස් රු: 300 000 කට තක්සේරු කළේ ය. මෙය ප්‍රාග්ධන ගිණුමෙන් වාර්තා වාර්තා කිරීමට එකඟ විය. එමෙන්ම අමාගේ හිමිකම ණය ගිණුමකට ඔහු මාරු කිරීමට එකඟ විය.

අ. හවුල් ව්‍යාපාරය 24.03.31 අවසන් වර්ෂයට උපයා ඇති ශුද්ධ ලාභය රු:............................................

ආ. අමාගේ 24.03.31 ණය ගිණුමේ ශේෂය ........................................................

**41.** සීමා සහිත සමාගම පහත ප්‍රකාශන සත්‍ය $(T)$ ද අසත්‍ය $(F)$ යන්න ලියා දක්වන්න.

| **කොටස්** | **සත්‍ය** (T) / **අසත්‍ය** (F) |
|---|---|
| A. ප්‍රසාද **කොටස්** නිකුතු මගින් සමාගමේ මුළු හිමිකම වැඩි වේ. | ........................................ |
| B. හිමිකම් නිකුතුවක් මගින් සමාගමේ හිමිකම මෙන්ම වත්කම වැඩි වේ. | ........................................ |
| C. සාමාන්‍ය කොටස් හිමියන්ට මුදලින් ගෙවූ ලාභාංශ නිසා රඳවා ගත් ඉපයුම් අඩු වේ. | .................... |
| D. කාලච්ඡේද ව්‍යාපාර ලද අලාභය රඳවා ඉපයුම් වලින් අඩු කර පෙන්වයි. | ..................................... |

**42.** 2024 වර්ෂයේ මාර්තු මාසයේ නිෂ්පාදන සමාගමක භාවිතා කරන ලද තොග පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2024.03.01 දිනට ශේෂය ඒකක 1500 මිළ රු: 150 යි.

2024.03.05 ගැණුම් ඒකක 1500 රු: 200/= බැගින්.

2024.03.10 විකුණුම් ඒකක 2000 යි. රු: 300 බැගින්

2024.03.15 ගැණුම් ඒකක 1500 රු: 225/= බැගින්

2024.03.30 විකුණුම් ඒකක 2000 රු: 300 බැගින්

(i) තොග නිකුත් කිරීමට පෙර පිවිසි පෙර පිට ක්‍රමය$(FIFO)$ භාවිතා වන්නේ නම් ඉතිරි තොගයේ පිරිවැය ගණනය කරන්න. ............................................................

(ii) භාරිත සාමාන්‍ය මිල ක්‍රමය භාවිතා වන්නේ නම්, $(WAC)$ විකුණුම් පිරිවැය ................................



[ අනික් පිටුව බලන්න.

**43.** මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව පහත වගන්ති සම්පූර්ණ කරන්න.

A. පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශ භාවිතා කරන මූලික පාර්ශව වන්නේ ............................. .......................... වේ.

B. මූල්‍ය තොරතුරු යනු මූල්‍ය සම්පාදනය හා සම්බන්ධිත තීරණ ගැනීමට මූලික පාර්ශවයන්ට ප්‍රයෝජනවත් වන තොරතුරු ය. එම තොරතුරු ප්‍රයෝජනවත් වීමට නම් .......................................... හා ............................................ යන සාධක වලින් සම්පූර්ණ විය යුතුය.

**44.** 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහන් සමාගමේ පොත් වලින් උපුටා ගත් තොරතුරු පහත දැක්වේ.

| | (000) |
|---|---|
| - ණය ප්‍රාග්ධනය | 24000 |
| - ණය අනුපාතය | 20% |
| - පොලී වියදම | 1200 |
| - කාච්ඡේද ලාභය | 2400 |
| - බදු වියදම | 600 |

(i) හිමිකම් ප්‍රාග්ධනය ........................................................................

(ii) ණය හිමිකම් අනුපාතය ..........................................................

(iii)පොලී ආවරණ අනුපතය (වාර) ...............................................

**45.** පහත තොරතුරු සමාගමක නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිත කරන ලද අමුද්‍රව්‍ය වලට අදාළ වේ.

| | |
|---|---|
| - ආර්ථික ඇණවුම් $(EOQ)$ ප්‍රමාණය ඒකක | 12000 |
| - ඇණවුම් වාර ගණන | 10 |
| - ඒකක වාර්ෂික රඳවා ගැනීමේ පිරිවැය | 1 |

(i) වාර්ෂික ඉල්ලුම ඒකක ..............................................................

(ii) ඇණවුමක පිරිවැය රුඃ .......................................................

**46.** සීමිත රංගිරි නිෂ්පාදන පොදු සමාගමේ අයවැය ගත නිෂ්පාදන ධාරිතාව ඒකක 50 000 කි. එහි පිරිවැය තොරතුරු පහත දැක්වේ,

- ඒකකයක මුළු පිරිවැය රුඃ 240 යි.
- ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය රුඃ 500 000 කි.
- ස්ථාවර නිෂ්පාදන නොවන පොදු කාර්ය පිරිවැය රුඃ 250 000 කි.
- විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයම ඒකක රුඃ 50/= යි.
- විචල්‍ය නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය ඒකකයකට රුඃ 75/=
- සෘජු පිරිවැය සියල්ල ම විචල්‍ය පිරිවැය වේ.

පහත දෑ ගණනය කරන්න.

(i) ඒකකයක ප්‍රාථමික පිරිවැය ...................................................

(ii) මුළු නිෂ්පාදන පිරිවැය (රුඃ000) ..........................................

(iii)මුළු පොදු කාර්ය පිරිවැය (රුඃ000) .....................................



[ අනික් පිටුව බලන්න.

**47.** සීමිත කැලුම් පොදු සමාගම 23.4.1 දින කල්බදු ගෙවීමේ ක්‍රමයකට යන්ත්‍ර අත්පත් කර ගත්තේ ය. ඊට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| - වාර්ෂික කල්බදු වාරිකය | රු: 600 000 යි |
| - කල්බදු කාලය වසර | 04 යි. |
| - ඵලදායි ජීව කාලය වසර | 05 යි. |
| - කල් බදු වල මුළු පොළිය | 474 000 |
| - මූලික ගෙවීම | 200 000 |
| - සවි කිරීමේ පිරිවැය | 100 000 |
| - ගම්‍ය පොලී අනුපාතය | 10% |
| - සුංබුං අගය | 226 000 |

24.03.31 දිනට පළමු කල්බදු වාර්ක නිසි පරිදි ගෙවා ඇත. 24.03.31 දිනට පහත දෑ ගණනය කරන්න. (වත්කමේ අයිතිය ගැණුම්කරුට හිමි වේ.)

(i) 24.03.31 දින ජංගම වගකීම ................................................

(ii) 24.03.31 දිනට ජංගම නොවන වගකීම .............................

(iii)24.03.31 දිනට භාවිත අයිතිය ඇති වත්කමේ ධරණ අගය ..................................

**48.** ඇගළුම් නිෂ්පාදන සමාගමක නිෂ්පාදන අංශ දෙකක් හා සේවා අංශයක් ක්‍රියාත්මක වේ. ඒවා නිමවුම් අංශ, එකලස් අංශ හා ගබඩා ලෙෂ ක්‍රියාත්මක වේ.

- නිමවුම් අංශයේ අන්තර් ග්‍රහන අනුපාතය ශ්‍රම පැයකට රු: 120 කි.
- එකලස් අංශයේ අන්තර් ග්‍රහන අනුපාතය යන්ත්‍ර පැයකට රු: 100 කි.

නිෂ්පාදන ඒකකයක අදාළ සත්‍ය පැය හා අයවැයගත පැය ගණන

| නිෂ්පාදන අංශය | සත්‍ය පැය | අයවැය ගත පැය |
|---|---|---|
| නිමවුම් අංශය ශ්‍රම පැය | 5 | 6 |
| එකලස් අංශය යන්ත්‍ර පැය | 4 | 5 |

අයවැය ගත නිෂ්පාදන එකක ගණන 2000 කි.

ඒකකයක ප්‍රාථමික පිරිවැය රු: 1600 කි.

පහත ද ගණනය කරන්න.

(i) නිමවුම් අංශයේ අයවැය ගත පොදු කාර්යය පිරිවැය රු:............................................

(ii) එකක නිෂ්පාදන පිරිවැය රු:............................................

**49.** ව්‍යාපාරයක ක්‍රියාකාරි මට්ටම් දෙකක විකුණුම් හා ලාභා අලාභ පහත දැක්වේ.

| ක්‍රියාකාරී මට්ටම | විකුණුම් | ලාභ /(අලාභ) |
|---|---|---|
| 1000 | 100 000 | (5000) |
| 1500 | 150 000 | 5000 |

(i) සමච්ඡේදන ලක්ෂ්‍ය ඒකක වලින් රු:..............................................

(ii) එකක 5000 ක් අලෙවි කරන්නේ නම ලාභය රු:..............................................

**50.** සීමිත තිසර පොදු සමාගම නව යන්ත්‍රයක් මිලට ගැනීමට සලකා බලමින් සිටී. නව යන්ත්‍ර මිලට ගතහොත් පවතින යන්ත්‍ර රු: 250000 අලෙවි කිරීමට හැකි වේ. නව යන්ත්‍ර ඵලදායි ජීව කාලය වසර 04 කි. යන්ත්‍ර අදාළ තොරතුරු පහත දැක්වේ.

| | (රු: 000) |
|---|---|
| - නව යන්ත්‍රයේ ගැණුම් මිල | රු: 800 |
| - සවි කිරීමේ පිරිවැය | රු: 100 |
| - අපේක්ෂිත මෙහෙයුම් මුදල් ඉතිරිය (වාර්ෂික) | රු: 300 |
| - නව යන්ත්‍රයේ විකිණිය හැකි මිල | රු: 160 |
| - කාරක ප්‍රාග්ධනය | රු: 100 |

කාරක ප්‍රාග්ධනය ව්‍යාපෘතිය අවසානයේ අයකරගත හැකිය.

පහත ද ගණනය කරන්න.

(i) මූලික ආයෝජනය රු:..............................................

(ii) 4 වන වසරේ මුළු මුදල් ගලා ඒම් රු:..............................................

(iii)පිලිගෙවුම් කාලය ……………………………

උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
General Certificate of Education (Advanced Level) Examination ,August 2024

ගිණුම්කරණය II
Accounting II

33 S II

පැය තුනයි
*Three hours*

අවසාන වාර පරීක්ෂණය

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
Additional Reading Time - 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.**

උපදෙස් :
- * පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- * සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- * අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.
- * මෙම ප්‍රශ්න පත්‍රයට **ලකුණු 200** ක් හිමි වේ.

**1.** සීමිත වික්‍රම පොදු සමාගමේ 2024.03.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | විස්තරය | හර (000) | බැර (000) |
|---|---|---|---|
| - | දේපළ පිරියත උපකරණ (පිරිවැය) | 95 000 | - |
| - | 2024.03.31 ක්ෂය වෙන් කිරීම. | | 15 500 |
| - | භාවිත අයිතිය ඇති වත්කම් (යන්ත්‍ර) | 8000 | - |
| - | කල්බදු වගකීම් | | 8000 |
| - | කාර්යාලයීය උපකරණ විකිණීමෙන් ලද ලාභය | | 500 |
| - | විකුණුම් | | 70800 |
| - | විකුණුම් පිරිවැය | 23200 | |
| - | 2024.3.31 දිනට තොග | 1800 | |
| - | වෙනත් ආදායම් | | 800 |
| - | වෙළෙඳ ලැබිය යුතු දෑ | 2850 | |
| - | වෙළඳ ගෙවිය යුතු දෑ | | 1500 |
| - | ගෙවූ ලාභාංශය | 300 | |
| - | මුදල් හා මුදල් සමාන දෑ | 250 | |
| - | ප්‍රකාශ කළ ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස්) | | 40 000 |
| - | 2023.4.1 රඳවා ඉපයුම් | | 4450 |
| - | විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | 4650 | |
| - | පරිපාලන වියදම් | 3500 | |
| - | වෙනත් වියදම් | 1200 | |
| - | මූල්‍ය වියදම් | 500 | |
| - | ගෙවූ ආදායම් බදු | 1350 | |
| - | 2023.4.1 ආදායම් බදු ප්‍රතිපාදනය | | 450 |
| - | 2023.4.1 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන | | 600 |
| | | 142 600 | 142 600 |



අනික් පිටුව බලන්න.

අතිරේක තොරතුරු

2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට පෙර පහත තොරතුරු සැලකිල්ලට ගත යුතුය. අධ්‍යක්ෂවරු මූල්‍ය ප්‍රකාශන අනුමත කරන්නේ 2024.6.15 දිනය.

01. 2024.3.31 දිනට අවසන් තොග වල පිරිවැය ($WAC$) ගණන කර ඇත්තේ භාරිත සාමාන්‍ය මිළ ක්‍රමයට ය. එහෙත් 2024.3.31 දිනට අවසන් තොග ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමට අනුව ගණන කර ඇති අතර එහි වටිනාකම රුː 2000 000 කි. අවසන් තොග මේ වසරේ සිට ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමයට ගණනය කිරීමට තීරණය කර ඇත.

02. සමාගම සතු කාර්යාලයීය උපකරණ 2023.4.01 රුː 2500 000 විකුණා ඇති අතර ඉන් ලද ලාභය 500 000 කි. මෙම අලෙවිය නිසි පරිදි ගිණුම්ගත කර ඇත. මෙම කාර්යාලය උපකරණ වල පිරිවැය හා සමුච්චිත ක්ෂය වෙන් කිරීම පිළිවෙළින් රුː3000 000 හා රුː 1000 000 කි.

03. ශේෂ පිරික්සුම දක්වා ඇති දේපළ හා පිරියත සහ ඒවායේ සමුච්චිත ක්ෂය වෙන් කිරීම් පහත දැක්වේ.

| විස්තරය | 2024.3.31 දිනට ශේෂය(000) | 2024.3.31 ක්ෂය වෙන් කිරීම් (000) |
|---|---|---|
| - ඉඩම් | 15 000 | - |
| - ගොඩනැගිලි | 45 000 | 7 000 |
| - මෝටර් රථ | 30 000 | 6 000 |
| - කාර්යාල උපකරණ | 5000 | 2 500 |
| | 95 000 | 15 500 |

(i) 2024.3.31 දින ඉඩම් මුල් වරට රුː 16000 000 ප්‍රත්‍යාගණනය කර ඇති අතර ඒ පිළිබඳ ගිණුම් පොත් වල ලියා නැත.

(ii) ගොඩනැගිලි 2024.3.31 රුː 400 00 000 ප්‍රත්‍යාගණනය කරන ලදී. මෙම ගොඩනැගිලි මීට පෙර ප්‍රත්‍යාගණනයෙන් 1500 000 ඌණතාවයක් වාර්තා කර තිබුණි. ප්‍රත්‍යාගණන ගිණුම්ගත කර නැත.

(iii) මෝටර් රථ වල ඵලදායි ජීව කාලය වර්ෂ 10 කට 2022.4.1 තීරණය කර තිබූ අතර,2023.4.1 ඒවායේ ඉදිරි ඵලදායි ජීව කාලය වසර 6 ක් බව තීරණය විය. කෙසේ වෙතත් එම සමාලෝචනය නොසලකා මෝටර් රථ වසර තුළ ක්ෂය කර තිබුණි.

දේපළ පිරියත උපකරණ ඒවායේ පිරිවැය මත වාර්ෂිකව 10% ක්ෂය කරයි වසරේ ක්ෂය ගිණුම් ගත කර ඇත.

04. භාවිත අයිතිය ඇති යන්ත්‍රයක් 2023.4.1 කල්බදු ගෙවීම් ක්‍රමයට ලබාගත් අතර කල්බදු කාලය වසර 4 වන අතර ඵලදායි ජීවකාලය වසර 05 කි. ප්‍රවර්ථන වසරේ කල්බදු පොලිය රුː 800 000 හා ඉදිරි වර්ෂයේ කල්බදු පොළිය 640 000 කි. කල්බදු වාරිකය රුː 2400 000 කි. පළමු කල්බදු වාරික 2024.3.31 දිනට ගෙවිය යුතුව ඇත. (මෙම වත්කම කල්බදු දීමනාකරුට පැවරේ.)

05. වර්ෂය තුළ වගකීම් සහතික මත අලුත්වැඩියා වියදමක් ලෙස රුː 480 000 ගෙවා ඇති අතර එය පරිපාලන වියදම තුළ ගිණුම් ගත වී ඇත. 2024.3.31 අවසන් වර්ෂයට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනය රුː 690 000 ලෙස ඇස්තමේන්තු කර ඇත.

06. 2024.01.01 දින ගණුදෙනුකරුවෙකු සමඟ ඇති කරගත් ගිවිසුමකට අනුව ඉදිරි මාස 06 ක කාලයක් සඳහා භාණ්ඩ විකිණීමට බැඳී ඇත. ඒ අනුව භාණ්ඩ තොගයේ විකුණුම් වටිනාකම රුː 600 000 වේ. මේ සඳහා ලද මුදල් වෙනත් ආදායම තුළ ගිණුම්ගත කර ඇත. දැනට මාස 03 කට අදාළ භාණ්ඩ ගණුදෙනුකරු වෙත ලබා දී ඇත. (මාසයට ලබා දිය යුතු තොගයේ විකුණුම් වටිනාකම රුː 100 000 කි.)

07. 2023/24 වර්ෂයේ ආදායම් බදු ඇස්තමේන්තුව රුː 1300 000 කට තක්සේරු කර ඇත. ගෙවූ ආදායම් බදු තුල 2022/23 වර්ෂය සඳහා රුː 400 000 ආදායමේ බදු එකඟ වී ගෙවා ඇත. ඉතිරිය මෙම වසරේ ආදායමේ බදු සඳහා අදාළ වේ.

08. 2024.3.01 සමාගමට විරුද්ධව ගණුදෙනුකරුවෙකු නඩුවක් පැවරූ රුː 500 000 වන්දි ඉල්ලා ඇති අතර සමාගමේ නීතිඥයින් මතයට අනුව මේ සඳහා 75% වන්දි මුදලක් ගෙවීමට සිදු වෙතැයි ඇස්තමේන්තු විශ්වාසදායක ලෙස තහවුරු කර ඇත.

09. 2024.3.31 වෙළඳ ලැබිය යුතු දෑ වළ ඇතුළත්ව රුː 150 000 ණයගැතියකු හානිකරණ වී ඇති බව 2024.5.30 වාර්තා වී ඇත.

10. අධ්‍යක්ෂවරු පහත දෑ තීරණය කර ඇත.
   1. පොදු සංචිතයට රුː 500 000 මුදලක් මාරු කිරීම.
   2. සාමාන්‍ය කොටස් හිමියන්ට රුː 2 අවසන් ලාභාංශ ගෙවීමට යෝජනා කර ඇත.

**අවශ්‍ය වන්නේ,**

1. 2024.3.31 අවසන් වර්ෂය සඳහා ලාභ අලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය
2 2024.3.31 අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
3. 2024.3.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

**2.** (අ) නිෂ්පාදන සමාගමක් තම නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය 03 ක් භාවිතා කරයි. එම අමුද්‍රව්‍ය සඳහා තොරතුරු පහත දැක්වේ.

| | x | y | Z |
|---|---|---|---|
| නිමි ඒකකයකට අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමාණය $(Kg)$ | 8 | 6 | 4 |
| යළි ඇණවුම් ප්‍රමාණය | ? | 20 000 | 15 000 |
| උපරිම තොග මට්ටම | 104000 | ? | ? |
| සාමාන්‍ය පොරොත්තු කාලය (සති) | 08 | 07 | 06 |
| අවම පොරොත්තු කාලය (සති) | 04 | 03 | 02 |

උපරිම නිෂ්පාදනය ඒකක 1000
අවම නිෂ්පාදනය ඒකක 500

**පහත දෑ ගණනය කරන්න.**
1. x අමුද්‍රව්‍ය සඳහා යළි ඇණයුම් ප්‍රමාණ හා යළි ඇණයුම් මට්ටම
2. Y අමුද්‍රව්‍ය සඳහා යළි ඇණයුම් මට්ටම හා උපරිම තොග මට්ටම
3. Z අමුද්‍රව්‍ය අවම තොග මට්ටම හා සාමාන්‍ය තොග මට්ටම (ලකුණු 12)

(ආ) නිෂ්පාදන සමාගමක එකලස් හා නිමවුම් ලෙස නිෂ්පාදන අංශ දෙකක් හා ගබඩා ලෙස සේවා අංශයක වෙති. තොරතුරු පහත දැක්වේ.

| | **එකලස්** | **නිමවුම්** | **ගබඩාව** |
|---|---|---|---|
| වක්‍ර අමුද්‍රව්‍ය | 85 000 | 70 000 | 15 000 |
| වක්‍ර ශ්‍රමය | 25 000 | 10 000 | 5 000 |
| **අනෙකුත් නිෂ්පාදන** | **පොදු කාර්ය** | | |
| ගොඩනැගිලි කුලී | 120 000 | | |
| විදුලිය | 80 000 | | |
| සේවක රක්ෂණ | 60 000 | | |
| යන්ත්‍ර ක්ෂය | ? | | |

**අනෙකුත් තොරතුරු**

| | **එකලස්** | **නිමවුම්** | **ගබඩාව** |
|---|---|---|---|
| බිම් ප්‍රමාණය (වර්ග මීටර්) | 6000 | 4000 | 2000 |
| කිලෝ වොට් පැය (KWH) | 1000 | 500 | 500 |
| සේවක සංඛ්‍යාව | 30 | 20 | 10 |
| යන්ත්‍ර පිරිවැය | 500 000 | 400 000 | - |
| අයවැය ගත යන්ත්‍ර පැය | 16 600 | 10 000 | - |
| අයවැය ගත ශ්‍රම වැය | 8400 | 22800 | - |

| භාණ්ඩ වර්ගය | A | B |
|---|---|---|
| ඒකක සෘජු ද්‍රව්‍ය පිරිවැය | 210 | 310 |
| සෘජු ශ්‍රම පිරිවැය | 90 | 80 |

- A භාණ්ඩය නිෂ්පාදන කිරීමට යන්ත්‍ර පැය 3 හා ශ්‍රම පැය 02 අවශ්‍ය වේ. B භාණ්ඩයට නිෂ්පාදනය කිරීමට යන්ත්‍ර පැය 4 හා ශ්‍රම පැය 02 වැය වේ.
- ගබඩා අංශයේ පොදු කාර්ය පිරිවැය නිෂ්පාදන අංශය අතර එකලස් අංශය 60% හා නිමවුම් අංශය 40% ලෙස නැවත විභජනය කරයි.
- යන්ත්‍රවල වටිනාකම මත වාර්ෂික 10% ක්ෂය කරනු ලබයි.

1. A භාණ්ඩයේ විකුණුම් මිල මත 20% ලාභයක් සහිත භාණ්ඩ විකුණුම් මිල ලකුණු කරයි.
   B භාණ්ඩයේ පිරිවැය මත 20% ලාභයක් සහිත භාණ්ඩයේ විකුණුම් මිල තීරණය කරයි.

**අවශ්‍ය වන්නේ,**

1. පොදු කාර්ය විභවිත පත්‍රිකාව (නැවත විභජන සමඟ)
2. එකලස් අංශය හා නිමවුම් අංශයේ අන්තර්ග්‍රහණ අනුපාත
3. A භාණ්ඩයේ විකුණුම් මිල හා B භාණ්ඩයේ නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

(ලකුණු 28)

**3.** (අ) නීලා වෙළඳ ව්‍යාපාරයේ 2024.3.31 දිනට ශේෂ පහත දැක්වේ.

| | **(000)** |
|---|---|
| දේපළ පිරියත උපකරණ | 2400 |
| බඩු තොගය | 300 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 500 |
| මුදල් | 100 |
| | 33 00 |
| **හිමිකම්** | |
| ප්‍රාග්ධනය | 2500 |
| රඳවාගත් ඉපයුම් | 300 |
| **ජංගම නොවන වගකීම්** | |
| බැංකු ණය | 400 |
| ජංගම වගකීම් | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 100 |
| | 3300 |

**අප්‍රේල් මාසයේ සිදු වී ඇති ගණුදෙනු**

1. පිරිවැය රුः 100 000 භාණ්ඩ තොගයක් පිරිවැයට 25% ලාභයක් සහිතව ණයට විකුණා ඇත.
2. පිරිවැය 10 000 වූ භාණ්ඩ තොග ආපසු එවා ඇත. පිරිවැයට 25% ලාභයක් සහිත යැවූ තොග.
3. පිරිවැය රුः 200 000 ක භාණ්ඩ තොග මුදලින් රුः 75000 ගෙවා ඇති අතර ඉතිරිය ණයට ලබා ගෙන ඇත.
4. පිරිවැය 20 000 වූ භාණ්ඩ තොග ආපසු යවා ඇත.
5. 10% වට්ටමක් අඩුකර වෙළඳ ලැබිය යුතු දෑ වලින් රුः 270 000 ක මුදලක් ලැබී ඇත.
6. අයිතිකරු පිරිවැය රුः 600 000 වූ යන්ත්‍රයක් ව්‍යාපාරයට යොදවා ඇත.
